# HDFC බැංකුව

නව්‍ය මූල්‍ය විසඳුම් හරහා ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රී ලාංකිකයින්ගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා දශක තුනකට අධික කාලයක් පුරා දැයට මහඟු සේවයක් ඉටු කරන **HDFC** බැංකුව හා සම්බන්ධ වී ඔබේ වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙන යාමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් ඇති කිරීමට **HDFC** බැංකුව සූදානමින් සිටින බැවින් පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී, බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට අප හා එක් විය හැකිය.

**මෘදුකාංග ඉන්ජිනේරු [ශ්‍රේණිය IV]**

**වගකීම්**

- පරිශීලක අවශ්‍යතා විශ්ලේෂණය කිරීම.
- කේත ලිවීම හා පරීක්ෂා කිරීම, අවශ්‍ය පරිදි ඒවා ප්‍රසාදනය කිරීම හා නැවත ලිවීම සහ ව්‍යාපෘතියට සම්බන්ධ ඕනෑම ක්‍රමලේඛකයෙකු සමඟ සන්නිවේදනය කිරීම.
- නව මෘදුකාංග වැඩසටහන් හා පරිගණක මෙහෙයුම් පද්ධති පරීක්ෂා කිරීම, නිර්මාණය කිරීම සහ රචනා කිරීම.
- පරිගණක හා දෘඩාංග ක්‍රියාත්මක කරන මෘදුකාංග හා පද්ධති ඇගයීම.
- නවීකරණය විය යුතු ක්ෂේත්‍ර විශ්ලේෂණය කරමින් සහ හඳුනා ගනිමින් දැනට පවතින වැඩසටහන් සංවර්ධනය කිරීම.
- පවතින මෘදුකාංග නිෂ්පාදන ඒකාබද්ධ කිරීම සහ එකිනෙකට වෙනස් වේදිකා ඒකාබද්ධ ලෙස ක්‍රියා කිරීමට කටයුතු සැළසීම.
- තාක්ෂණික පිරිවිතර නිර්මාණය කිරීම.
- තාක්ෂණික රචකයන් සමඟ මෙහෙයුම් ලිපිගොනු රචනා කිරීම.
- මෘදුකාංග දෝෂ නිරීක්ෂණය සහ නිවැරදි කිරීම මඟින් පද්ධති පවත්වා ගෙන යාම.
- දැනට පවතින මෙහෙයුම් පද්ධති රචනා කිරීම හෝ නවීකරණය කිරීමේ අරමුණින් මෘදුකාංග පද්ධතිවල නඩත්තුව හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සේවාදායකයන් හා කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම.
- නව තාක්ෂණය පිළිබඳව සොයා බැලීම.
- ඉංජිනේරු මූලධර්ම හා ක්‍රම ලේඛණ භාෂා දැනුම යොදමින් HDFC බැංකුව සඳහා මෘදුකාංග විසඳුම් ගොඩනැගීම හා පරිගණක මෘදුකාංග යෙදුම් සැළසුම් කිරීම, සංවර්ධනය කිරීම, නඩත්තු කිරීම, පරීක්ෂා කිරීම හා ඇගයීම.

**සුදුසුකම්**

- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද සමඟ පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම.
  හෝ
- පරිගණක වැඩසටහන්කරණය පිළිබඳ වසර තුනක පළපුරුද්ද සමඟ පිළිගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම. (අවම වශයෙන් වසරක කාල සීමාවක් සහිත ඩිප්ලෝමාවක් විය යුතුය.)
- Java, dotNet, mobile application, C# සහ Oracle SQL භාවිතා කරමින් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක මෘදුකාංග සංවර්ධනයට දායක වී තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය**

- විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි **(Subject)** ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 06.12.2023 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.


HDFC බැංකුව
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැපැල් පෙට්ටිය 2085
කොළඹ 02
දුරකථනය : 0112356800